**නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය - 2016**

**--------------------------------------------------------------------**

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (ප්‍රසංජාබැ) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර (ජාසංස) 2011 දෙසැම්බර් 27 දින එළඹි අංක ටීඑෆ් 099870 දරන ප්‍රදාන ගිවිසුමේ II (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------**

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩිකිරීම සහ ගෘහස්ථ මට්ටමින් ස්ථානීය සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,559 කට සමාන එජඩො මිලියන 13.10 ක් වන අතර ඉන් රු.මිලියන 583.66 කට සමාන එජඩො මිලියන 5.08 ක් මූල්‍යයනය කිරීම සඳහා ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි

ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 26 දින දීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2016 දෙසැම්බර් 31 දිනට ගෙවන ලද එකතුව රු.මිලියන 99.67 ක් වූ එකතුකළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයට එරෙහිව අයකර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 5.08 | 583.66 | 400.00 | 1.24 | 182.18 | 1.47 | 212.66 |
| ශ්‍රී ලං ර | 6.80 | 835.20 | 219.35 | 0.68 | 102.73 | 2.59 | 352.16 |
| ජා ජ ස ජ ම | 1.04 | 119.46 | | 1.28 | 190.07 | 3.01 | 416.01 |
| ප්‍රතිලාභීන් | 0.18 | 20.68 | - | 0.12 | 18.39 | 0.20 | 29.70 |
| එකතුව | 13.10 | 1,559.00 | 619.35 | 3.32 | 493.37 | 7.27 | 1,010.53 |

ඉහත තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් ආරම්භ කර වර්ෂ 05 ක් ඉකුත්වීමෙන් පසුවත් රු.මිලියන 583.66 කට සමාන එජඩො මිලියන 5.08 ක් වූ මුළු ප්‍රදාන වෙන්කිරීමෙන් සියයට 29 ක් නියෝජනය වන රු.මිලියන 212.66 කට සමාන එජඩො මිලියන 1.47 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 38.17 ක් හා සියයට 53.30 ක්ව පැවතුණි. ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය 2017 දෙසැම්බර් 31 දක්වා

දීර්ඝ කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 3,268 දෙනෙකුට පමණක් මලාපවහන සම්බන්ධතා ලබා දී තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඒ පිළිබඳ සම්පූර්ණ සැලැස්මක් නොමැතිවීම හේතුවෙන් ඉතිරි මාස 12 ක කාලපරිච්ඡේදය තුළදී ප්‍රතිලාභීන් 8,561 දෙනෙකුට මලාපවහන සම්බන්ධතා ලබාදීමේ ඉලක්කය සපුරා ගැනීමේ හැකියාව ඉතා දුරස්ථ වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට මලාපවහන සම්බන්ධතා සැපයීමේ භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මලාපවහන සම්බන්ධතා පිළිබඳ ස්වභාවය | 2016 දෙසැම්බර් 31 දිනට සපයන ලද මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව | | ප්‍රගතිය |
|---|---|---|---|
| | ඉලක්කය | තථ්‍ය | % |
| ඍජු මලාපවහන සම්බන්ධතා | 1,236 | 1,234 | 99.83 |
| සාම්ප්‍රදායික ජලාපවහන දීර්ඝ කිරීම් සඳහා සම්බන්ධතා | 392 | 13 | 3.32 |
| පහසු කරන ලද ජලාපවහනය සම්බන්ධතා | 2,583 | 1,620 | 62.72 |
| නව විමධ්‍යගත ජාලයන් සඳහා සම්බන්ධතා | 565 | 392 | 69.38 |
| ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 3,785 | 9 | 0.23 |
| එකතුව | 8,561 | 3,268 | 38.17 |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම් සඳහා කොන්ත්‍රාත්තු 2016 මැයි 16 දින ප්‍රදානය කර තිබූ අතර, 2017 ජුනි 30 දිනට දෙහිවල, මොරටුව, කොලොන්නාව හා ජාඇල යනාදී ප්‍රදේශවල ජීවත්වන ප්‍රතිලාභීන් 3,785 ක් සඳහා එම සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුවන් වෙත පුහුණු ශ්‍රම බලකාය නොමැතිවීම, පිරිසිදු කිරීම් ඒකකවල අඩු නිෂ්පාදන ධාරිතාවය යනාදී කරුණු රාශියක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව යටතේ වූ කාර්යයන්වල අඩු භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. ඊට අමතරව, කොන්ත්‍රාත්කරු විසින් නිෂ්පාදනය කර සවිකිරීම සඳහා එකඟ වී තිබුණු පිරිසිදු කිරීම් ඒකක 3,785 කින් 2017 මැයි 31 දක්වා ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් සඳහා පිරිසිදු කිරීම් ඒකක 526 ක් සවිකර තිබුණි. තවද, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන ප්‍රතිලාභීන්ගේ අඩු ඉල්ලුම හේතුවෙන් එම ප්‍රදේශය සඳහා සැපයීමට අපේක්ෂා කළ මලාපවහන සම්බන්ධතා 95 ක

ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබූ බවත් 2017 මැයි 31 වන විටත් මලාපවහන සම්බන්ධතා 116 ක් පමණක් ලබාදීමට හැකි වී තිබූ බවත් අනාවරණය විය.

(ආ) 2017 මැයි 31 දිනට පෙර පහසුකරන ලද හා සම්ප්‍රදායානුකූල මලාපවහන දීර්ඝකිරීම් ලබාදීම සඳහා 2015 ජුනි 30 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව යටතේ මලාපවහන සම්බන්ධතා 1,475 ක් සැපයීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුගේ නොහැකියාවන් හේතුවෙන් දීර්ඝ කිරීම් 220 ක් පමණක් 2017 මාර්තු 31 දිනට ලබා දී තිබුණි.

(ඇ) පොම්පකිරීමේ ස්ථානයේ, ප්‍රධාන පොම්පාගාරයේ හා ප්‍රධාන ජලාපවහන නළයේ පසුව කරන ලද වෙනස්කිරීම් හේතුවෙන් ලූනාව නව විමධ්‍යගත ජාලයන් සඳහා සම්බන්ධතා සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව යටතේ නළ එළීම හා පෙරන ඉදිකිරීම, මුහුදු පිටාර මුව හා පොම්පකිරීමේ මධ්‍යස්ථානයට අදාළ සිවිල් වැඩ වලින් සියයට 72 ක අඩු ප්‍රගතියක් නිරීක්ෂණය විය.

**3.4 මූල්‍ය පාලන පිළිබඳ කරුණු**

**-------------------------------**

මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, 2016 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණි.